00090 34

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2022/2023

**දෙවන සෙමෙස්තරය**

**(පවත්වන ලද්දේ මැයි/ජුනි 2023)**

# BLM 1131 - සූක්ෂම ආර්ථික විද්‍යාව

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) ගණක යන්ත්‍ර භාවිතා කිරීමට හැක.

(05) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(06) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(07) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(08) අත් අකුරු පැහැදිලිව ලියන්න.

01.

i. අභිමතනුරූපී ආර්ථික විද්‍යාව (Normative Economics ) යතානුරූපී ආර්ථික විද්‍යාවෙන් (Positive Economics) වෙනස් වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. "ශ්‍රී ලාංකිකයන් විදෙස් රටවලට සංක්‍රමණය වීම ඉහල යාමට බලපාන සාධකයක් ලෙස <u>හිගකම</u> බලපා ඇති බවට අදහසක් පවතී" ඉහත ප්‍රකාශයේ ඉරි ඇඳි පදයට අවධානය යොමු කරමින් එම ප්‍රකාශය විමසන්න.

(ලකුණු 05)

iii. "ආර්ථික ප්‍රතිසංස්කරණ ඔස්සේ ලංකාවේ ආර්ථිකය වෙළෙඳපල ආර්ථික ආකෘතියක් ගනු ඇතැයි ඇතැමුන්ගේ අදහසයි." මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේ නම් එය තහවුරු කිරීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කරන්න.

(ලකුණු 05)

iv. "ආවස්ථික පිරිවැයේ ස්වභාවය අනුව නිෂ්පාදන මායිම් වක්‍රයේ (production possibility curve) හැඩය තීරණය වේ." මෙම ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද පිළිතුරට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

02.

සිසුවෙක් විසින් වෙළඳපල තුල කරනු ලැබූ සමීක්ෂණයකදී සතියක් තුල බිත්තර මිල හා ප්‍රමාණයන් පිලිබඳ එකතුකරගත් දත්තයන් පහත දැක්වේ.

| මිල *(P)* | ප්‍රමාණය *(Q)* |
|---|---|
| 5 | 75 |
| 10 | 50 |

මීට අමතරව සැපයුම් සමීකරණය ඔහු විසින් පහත පරිදි ගොඩනගා ඇත. $Qs = 10+5P$

i. ඉහත තොරතුරු වලට අදාලව ඉල්ලුම් වක්‍රය ගොඩනගන්න.

(ලකුණු 04)

ii. සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න.

(ලකුණු 04)

iii. සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකය කුමක්ද?

(ලකුණු 04)

iv. a. සමතුලිත මිලේදී සාමාන්‍ය පාරිභෝගික අදායම රු 50,000/- ක් වූ අතර අන් සාධක නොවෙනස්ව තිබියදී එම අදායම රු 75,000/- දක්වා ඉහල ගිය විට බිත්තර ඉල්ලුමද ඒකක 20කින් ඉහලගියේ නම් අදායම් ඉල්ලුම් නම්‍යතාව කුමක්ද?

(ලකුණු 04)

b. ඉහත (a.) අදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

03.

i. මෑත කාලයේ රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ උපරිම මිල සීමාකරණය රූප සටහන් ආධාරයෙන් පැහැදිලිකොට එය අසාර්ථකවීමට බලපෑ හේතු සැකවින් දක්වන්න.

(ලකුණු 06)

ii. " උපයෝගීතාවය යන්න පුද්ගල බද්ධ හෝ සාපේක්ෂ සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය. " ඉහත ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. පාරිභෝගිකයෙකුගේ ආදායම රු 28/-වන අතර ඔහු එම අදායම බනිස් සහ කෙසෙල්ගෙඩි මිලදී ගැනීමට වැය කරයි. බනිස් ගෙඩියක මිල ($P_B$) රු 2/- ක් වන අතර කෙසෙල් ගෙඩියක මිල($P_K$) රු 4/- කි. භාණ්ඩ දෙකට අදාල ආන්තික උපයෝගිතාවයන් පහත දැක්වේ.

| Q | 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| $MU_B$ (බනිස්) | 16 | 14 | 11 | 10 | 9 | 8 | 7 | 6 | 5 | 3 |
| $MU_K$ (කෙසෙල්) | 30 | 26 | 24 | 16 | 12 | 10 | 8 | 6 | 4 | 2 |

a) පාරිභෝගික සමතුලිතය සොයන්න.

(ලකුණු 06)

b) කෙසෙල් ගෙඩියක මිල රු 3/- දක්වා පහල ගියේ නම් හා නව පාරිභෝගික අදායම රු 27/- දක්වා අඩු වුයේ නම් නව පාරිභෝගික සමතුලිතය සොයන්න.

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

04.

i. නිෂ්පාදන ශ්‍රිතය ගොඩ නැගීමේදී යොදා ගන්න උපකල්පන තුනක් (03)ක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii. රූප සටහන් භාවිතයට ගනිමින් කෙටිකාලයේදී තාර්කික නිෂ්පාදන මට්ටම/අදියර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. නිෂ්පාදන ශ්‍රිතය $Q = 10L + 15L^2 - L^3$ ලෙස ඇස්තමේන්තු ගත කර ඇති විටෙක ශ්‍රමිකයන් පස් දෙනෙකු (05) පමණක් භාවිතා කිරීමට තීරණය කර ඇත්නම් පහත සංකල්පයන්ට අදාල අගයන් ගණනය කරන්න.

a) මුළු නිමවුම
b) ආන්තික නිමවුම
c) සාමාන්‍ය නිමවුම

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

05.

i. ප්‍රත්‍යක්ෂ පිරිවැය (Explicit Cost ) සහ ආරෝපිත පිරිවැය ( Implicit Cost ) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. නිෂ්පාදන ඒකක දහයක් (10) සිදුකිරීමට අදාල සාමාන්‍ය පිරිවැය ශ්‍රිතය $AC = \frac{100}{Q} +5 +10Q$ නම් සාමාන්‍ය පිරිවැය, මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය ගණනය කරන්න.

(ලකුණු 05)

iii. වැඩෙන පරිමානුකූල ඵල (Increasing Returns to scale ) සහ හීනවන පරිමානුකූල ඵල ( Decreasing returns to scale ) ගැලපෙන උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. පරිමානුකූල ආර්ථික නොපිරිමැසුම් (Diseconomies of scale ) ක්‍රියාත්මක වීමට බලපාන හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)
**(මුළු ලකුණු 20)**

06.

i. "වෙළඳපල බලය (Market power) සහ වෙළඳපල තරගකාරිත්වය අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි. "මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. පහත සංකල්පයන් / සංසිද්ධීන් කෙටියෙන් විස්තර කරන්න.

a) වැඩෙන ආර්ථික ඵල (Increasing Returns)

b) කෙටි කාලීන හා දිගු කාලීන නිෂ්පාදනය

c) පාරිභෝගික තාර්කික භාවය

d) හරස් ඉල්ලුම් නම්‍යතාව.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

****************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2022/2023

### දෙවන සෙමෙස්තරය

### (පවත්වන ලද්දේ මැයි/ජුනි 2023)

# BLM 1232 - රැකියා ස්ථානයේ මනෝ විද්‍යාව

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ **ප්‍රශ්න පහකට (05)** පිළිතුරු සැපයිය යුතුය.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නමයකින් (09) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

1. (අ) සේවා ස්ථානය වෙත මනෝවිද්‍යාව වැදගත් වන බවට හේතු 2ක් කෙටියෙන් දක්වන්න.

(ලකුණු 4 යි )

(ආ) සේවක චර්යා හැඩගැස්වීමට සෘණ උපස්තම්භන භාවිත කරන අවස්ථා නිදසුන් 2ක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි )

(ඇ) සේවකයන්ගේ කාර්යක්ෂමතාව ඉහල නැංවීමේදී ද්විතීක උපස්තම්භන (Secondary Reinforcements) භාවිතා කිරීමෙහි ඇති වැදගත් කම පැහැදිලි කරන්න. (ලකුණු 10 යි )

**(මුළු ලකුණු 20)**

2. (අ) සේවක අභිප්‍රේරණය ආයතනයකට වඩාත් ලාභදායී වීමට හේතු 2ක් දක්වන්න.

(ලකුණු 4 යි )

(ආ) සමාජවිද්‍යාත්මක අභිප්‍රේරණ යනු කුමක්දැයි හඳුන්වා ප්‍රධාන සාමාජීය අභිප්‍රේරණ මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි)

(ඇ) Herzberg ට අනුව "සේවකයින් ට රැකියා ස්ථානයේ ඇතැම් සාධක තෘප්තිය ගෙනදෙන අතර ඇතැම් සාධක අතෘප්තිය ඇති කරයි." මෙම කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20)**

3 (අ) රැකියා ක්ලමථ මූලාශ්‍ර 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4 යි)

(ආ) ක්ලමථය පිලිබඳ සාමාන්‍ය අනුගත වීමේ සහලක්ෂණය (General Adaptation Syndrome/GAS) යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 6 යි)

(ඇ) ක්ලමථය දිගුකාලීන වීම සේවකයෙකු ට කෙසේ බලපාන්නේද යන්න නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20)**

4 (අ) සෞඛ්‍ය සම්පන්න රැකියා ආයතනයක් යනු කුමක්දැයි පැහැදිලිකර එබඳු ආයතනවල දැකිය හැකි විශේෂ ලක්ෂණ 2 ක් දක්වන්න.

(ලකුණු 4 යි)

(ආ) සේවක ඵලදායිතාව අඩුවීමට බලපාන මානසික අක්‍රමිකතා 2ක් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි)

(ඇ) සේවකයන්ගේ ප්‍රජානන හැකියාව තක්සේරු කිරීමේදී ප්‍රමාප පරීක්ෂණ වල වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 20)

5 (අ) ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි නම් කරන්න.

(ලකුණු 4 යි)

(ආ) සේවකයෙකුට චිත්තවේගී බුද්ධියේ අංගයක් ලෙස උසස් සහකම්පන ගුණාංග පැවතීම රැකියා ආයතනය අකෙරෙහි බලපාන්නේ කෙසේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි)

(ඇ) රැකියාව සඳහා වඩා වැදගත් වන්නේ සාමාන්‍ය බුද්ධියද නැතිනම් චිත්තවේගී බුද්ධියද ඔබගේ පිළිතුර තර්කානුකූලව දක්වන්න.

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 20)

6 (අ) ඩොනල්ඩ් සුපර් ට අනුව පුද්ගල ස්ව සංකල්පය වර්ධනය වීමට බලපාන සාධක 4 දක්වන්න.

(ලකුණු 4 යි)

(ආ) ඈන් රෝ ට අනුව පුද්ගලයෙකුගේ වෘත්තීය හැසිරීමකට බලපාන විචල්‍යයන් 4ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6 යි)

(ඇ) දෙමාපියන් විසින් දරුවන් හදා වඩා ගන්නා ආකාරය පුද්ගලයෙකුගේ වෘත්තීය වරණය කෙරෙහි බලපාන ආකාරය අදාළ වෘත්තීය වරණ න්‍යාය ඇසුරෙන් පැහැදිලි කරන්න.

7 (අ) සේවකයින් ගේ නිවැරදි තීරණ ගැනීම මගින් සේවා ස්ථානයට අත්වන වාසි ලයිස්තුවක් සකසන්න.

(ලකුණු 4 යි)

(ආ) සේවා ස්ථානය තුල විධාන තීරණ ගැනීම (Command Decision Making ) යනු කුමක්දැයි නිදසුනක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6 යි)

(ඇ) තීරණ ගැනීමට උපකාර වන ගැටළු විසඳීමේ ක්‍රමශිල්ප 4 ක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20)**

8 (අ) රැකියා ස්ථානයේ නායකත්ව කුසලතා දියුණු කරගැනීමට සේවකයන් විසින් අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග ලැයිස්තුවක් පිළියෙළ කරන්න. (ලකුණු 4 යි)

(ආ) කැරිස්මා නායකත්වය යනු කුමක්දැයි පැහැදිලි කර එවැනි නායකත්වයන් තුල විශේෂයෙන් දැකිය හැකි ක්‍රමෝපායන් 4ක් දක්වන්න. (ලකුණු 6 යි)

(ඇ) "නායකත්ව අභිප්‍රේරණයේ දී පුද්ගල කේන්ද්‍රී නායකත්වයට වඩා සමාජ කේන්ද්‍රී නායකත්වය ප්‍රබල වේ." මෙම කියමන විමසන්න. (ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20)**

9 (අ) රැකියාවේදී පුද්ගල පෞරුෂයන් අවබෝධ කර ගැනීමෙහි ප්‍රතිලාභ 4ක් දක්වන්න. (ලකුණු 4 යි)

(ආ) පුද්ගලයෙකුට ගැලපෙන රැකියාවන් හඳුනා ගැනීම ට වැදගත් වන DISK පෞරුෂ ආකෘතියෙහි ප්‍රධාන සාධක 4 කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6 යි)

(ඇ) පුද්ගලයෙකුගේ පෞරුෂ වර්ධනයට ළමා වියෙහි ඇති බලපෑම Freud ගේ න්‍යාය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

**(මුළු ලකුණු 20)**

**************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2022/2023

### දෙවන සෙමෙස්තරය

## BLM 1233 - ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ඉතිහාසය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුය.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න නමයකින් (09) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

1.

a) ස්වභාවික සම්පත් හැමවිටම රටක ආර්ථික දියුණුවට ආශිර්වාදයක් වශයෙන් පවතින්නේයැයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න?

(ලකුණු 12.5)

b) ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට ස්වභාවික සම්පත් හිඟකම බාධාවක් ද? සුදුසු නිදර්ශන ඇසුරෙන් පිළිතුරු ඉදිපත් කරන්න?

(ලකුණු 12.5)

(මුළු ලකුණු 25)

2.

a) ශ්‍රම බලකාය ඉහළ රටකට ලබාගතහැකි සුවිශේෂ ආර්ථික වාසි මොනවාද?

(ලකුණු 12.5)

b) බ්‍රිතාන්‍ය පාලනය සමයේ විදේශික ශ්‍රමිකයින් මෙරටට ගෙන ඒමට තුඩුදුන් හේතුන් සැකෙවින් පැහැදිළි කරන්න ?

(ලකුණු 12.5)

(මුළු ලකුණු 25)

3.

a) රටක ආර්ථික දියුණුවට ව්‍යවසායක පන්තියක බිහිවීමේ ඇති වැදගත්කම කුමක්ද?

(ලකුණු 12.5)

b) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට වර්ධනය වෙමින් තිබූ ව්‍යවසායක පන්තිය නිදහසින් පසු අඩාල වීම මෙරට ආර්ථික දියුණුවට කෙසේ බලපෑවේද?

(ලකුණු 12.5)

(මුළු ලකුණු 25)

4.

a) ශ්‍රී ලංකාවේ පුරාතන යුගවල අනුගමනය කරනලද ආර්ථික ප්‍රතිපත්තීන් වර්තමානයට ගැලපීමට සුදුසුය යන තර්කයට ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 12.5)

b) පුරාතන යුගවල අනුගමනය කරනලද ආර්ථික ප්‍රතිපත්තීන්වල තිරසර බව උපතේ සිට විපත දක්වා මනුෂ්‍ය ක්‍රියාකලාපයට ගැට ගැසී තිබුණි. මෙය තහවුරු කිරීමට ඔබ ඉදිරිපත් කරන සාක්ෂි මොනවාද ?

(ලකුණු 12.5)

(මුළු ලකුණු 25)

5.

a) යුරෝපා ආක්‍රමණ වලින් සිදුවූ සමාජ ආර්ථික බලපෑම ඉන්දීය ආක්‍රමණවලට වඩා වෙනස් වූයේ යැයි ඔබට තර්ක කල හැකිද?.

(ලකුණු 12.5)

b) යුරෝපා පාලන සමයන්තුළ ශ්‍රී ලංකවේ ඉහළ සමාජ සංචලතාවයක් පැවතීමට තුඩුදුන් හේතුන් මොනවද?

(ලකුණු 12.5)

6.

a) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික පසුගාමීත්වයට තුඩුදෙන ඓතිහාසික හේතුසාධක මොනවද? මේවා ඉවත්කල හැක්කේ කෙසේද?

(ලකුණු 12.5)

b) නිදහසින් පසු ලබාදෙන අතාර්කික රාජ්‍ය සහනාධාර කොතෙක් දුරට මෙරට ග්‍රාමීය ආර්ථික පසුගාමීත්වයට තුඩු දෙන්නේද?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

7.

a) ශ්‍රී ලංකාවේ ධනේශ්වර හා සමාජවාදී යන ප්‍රතිපත්තින් දෙකම බාහිරින් මෙරටට අරෝපණය කල බැවින් ඒවා මෙරටට නොගැලපේ යන මතය සමග ඔබ කොතෙක් දුරට එකඟ වන්නේද?

(ලකුණු 12.5)

b) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංක්‍රාන්තියේ ආරම්භක අවධියේදී වෙරළබඩ ජනතාව රටේ ඉහළ මට්ටමක සිටීමට තුඩුදුන් සාධක පසුව අහෝසි වී ගියේ කුමක් නිසාද?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

8.

a) රටක දියුණුවට ආර්ථික හා සමාජ යන අංශ දෙකේම පරිවර්තනයක් සිදුවිය යුතුයයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 12.5)

b) ආර්ථික සංවර්ධනයත් සමඟ රටක කෘෂි අංශයේ සාපේක්ෂක වැදගත්කම පහළ යා යුතුය යන්නට ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

9. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් (02) පිළිබඳ සවිස්තරාත්මක සටහන් ලියන්න.

a) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ තේ වගාව

b) රෝස්ටෝව්ගේ ආර්ථික පරිණාම ආකෘතිය

c) බ්‍රිතාන්‍ය පාලනසමය තුල ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය

d) සමාජ පරිණාමය පිළිබඳ කාල් මාර්කස් ගේ ආකෘතිය.

(එක පිළිතුරකට ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

*************

6.

a) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථික පසුගාමිත්වයට තුඩුදෙන ඓතිහාසික හේතුසාධක මොනවද? මේවා ඉවත්කල හැක්කේ කෙසේද?

(ලකුණු 12.5)

b) නිදහසින් පසු ලබාදෙන අතාර්කික රාජ්‍ය සහනාධාර කොතෙක් දුරට මෙරට ග්‍රාමීය ආර්ථික පසුගාමිත්වයට තුඩු දෙන්නේද?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

7.

a) ශ්‍රී ලංකාවේ ධනේශ්වර හා සමාජවාදී යන ප්‍රතිපත්තින් දෙකම බාහිරින් මෙරටට අරෝපණය කල බැවින් ඒවා මෙරටට නොගැලපේ යන මතය සමග ඔබ කොතෙක් දුරට එකඟ වන්නේද?

(ලකුණු 12.5)

b) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංක්‍රාන්තියේ ආරම්භක අවධියේදී වෙරළබඩ ජනතාව රටේ ඉහළ මට්ටමක සිටීමට තුඩුදුන් සාධක පසුව අහෝසි වී ගියේ කුමක් නිසාද?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

8.

a) රටක දියුණුවට ආර්ථික හා සමාජ යන අංශ දෙකේම පරිවර්තනයක් සිදුවිය යුතුයයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 12.5)

b) ආර්ථික සංවර්ධනයත් සමඟ රටක කෘෂි අංශයේ සාපේක්ෂක වැදගත්කම පහළ යා යුතුය යන්නට ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න?

(ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

9. පහත සඳහන් ඒවායින් ඕනෑම දෙකක් (02) පිළිබඳ සවිස්තරාත්මක සටහන් ලියන්න.

a) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ තේ වගාව

b) රෝස්ටෝව්ගේ ආර්ථික පරිණාම ආකෘතිය

c) බ්‍රිතාන්‍ය පාලනසමය තුල ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය

d) සමාජ පරිණාමය පිලිබඳ කාල් මාර්කස් ගේ ආකෘතිය.

(එක පිළිතුරකට ලකුණු 12.5)
(මුළු ලකුණු 25)

*************

0-7

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - පළමු වර්ෂය 2022/2023

දෙවන සෙමෙස්තරය

පවත්වන ලද්දේ මැයි/ජුනි 2023

# BLM 1234 – කම්කරු නීතිය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

(07) අත් අකුරු පැහැදිලිව ලියන්න.

1. කම්කරු නීති විෂය ඉගෙනුම ලබන රමේෂ් ට ඔබගෙන් දැන ගැනීමට අවශ්‍ය වී ඇත්තේ:

(අ) තාවකාලික සේවා නියුක්තිය සහ අනියම් සේවා නියුක්තිය යනු එකම රැකියා ස්වභාවයකින් යුතු සේවා නියුක්තියක්ද? සහ

(ආ) නිශ්චිත කාලීන සේවා ගිවිසුමක ගිවිසුම්ක කාලය අවසන් වීම මත සිදුවන සේවා සමාප්තියකට එරෙහිව කම්කරු විනිශ්චය සභාවකින් සහන ඉල්ලා සිටිය හැකිද?

යන්නයි. මෙම ගැටලු වලට රමේෂ්ට උපදෙස් ලබා දෙන්න.

(ලකුණු 20)

2. ළමා ශ්‍රමිකයා සහ කාන්තා ශ්‍රමිකයාගේ අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කිරීම උදෙසා නෛතික ආරක්ෂණයන් සපයා තිබුණද ළමා ශ්‍රමිකයා සහ කාන්තා ශ්‍රමිකයා ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ සැබැවින්ම සුරක්ෂිතද යන්න තවමත් ප්‍රශ්නාර්ථයකි. අදහස් දක්වන්න.

(ලකුණු 20)

3. රැකියා ගිවිසුමක් සේවය සැපයීම සඳහා වන ගිවිසුමකින් වෙනස් වන්නේ කෙසේදැයි වටහාගෙන රැකියා ගිවිසුමක් හඳුනා ගැනීම උදෙසා අධිකරණය විසින් භාවිතා කරනු ලබන විවිධ මිනුම් දඬු කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

4. ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ සේවකයකුගේ සේවය අවසන් කිරීම පිළිබඳව ව්‍යවස්ථාදායකය මෙන්ම අධිකරණය සේවා යෝජක වෙත මාර්ගෝපදේශ සපයා තිබේදැයි විග්‍රහ කරන්න.

(ලකුණු 20)

5. රැකියා පරිසරය තුළ ශ්‍රමය සපයන කම්කරු ජනතාවගේ සුභසාධනය උදෙසා ඓතිහාසිකව සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කම්කරු නීති ව්‍යවස්ථා කෙසේ විකාශනය වී තිබේදැයි විමර්ශනය කරන්න.

(ලකුණු 20)

6. පරිවාසික සේවකයෙක් ස්ථිර සේවා නියුක්තියට අයත් ස්ථිර සේවකයෙක්ද? සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

7. ශ්‍රී ලංකාවේ රැකියා පරිසරය තුළ කාර්මික ආරවුල් නිරවුල් කිරීම උදෙසා යොදාගත හැකි කාර්මික ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රමවේද මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 20)

8. විනය ගරුක, ශික්ෂා සම්පන්න වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කිරීමටත්, කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කොට තහවුරු කිරීමටත්; වර්ෂ 1919 වෙසයිල්ස් සම්මුතිය/සාම සම්මුතිය මගින් ස්ථාපිත කළ අන්තර්ජාතික යාන්ත්‍රණයේ ක්‍රියාකාරිත්වය කෙසේදැයි හඳුනාගෙන, එය ශ්‍රී ලංකාව විෂයෙහි කවර දායකත්වයක් සපයනු ලබන්නේ දැයි වැඩිදුරටත් විමර්ශනය කරන්න.

(ලකුණු 20)

***********

0000156

Index No : ..................

Institute of Human Resource Advancement (IHRA)
University of Colombo, Sri Lanka

Bachelor of Labour Management - 2022/23

Year I Semester II

*(Held In May/June 2023)*

# BLM 1235 - English Language

**Instructions to the Candidates**

(1) Time allocated for the examination is Three (03) hours.

(2) This Paper consists seven (07) questions and eight (08) pages including Part A and Part B

(3) **Answer all the questions of Part A and one (01) question from Part B.**

(4) Write your Index Number on all pages of answer script.

(5) Tie up all answer sheets at the end of the examination.

(6) If a page or a part of this question paper is not printed, please inform the Supervisor immediately.

## *Part A*

1. Read the following text and answer the questions given below. (15 marks)

Today we take the tomato for granted. It is in our salads, in our soup, in our ketchup, and often in our gardens. Tomato juice is a refreshing way to get a serving of vegetables. However, our relationship with the tomato was once a very different matter.

Let's start with ketchup, an American food staple. We dip our fries in it, pour it on our burgers, slather it on our hot dogs, and eat our eggs with it. In the 1700s, "ketchup" was widely used in China and British sailors took the sauce back to Great Britain with them. It wasn't made from tomatoes though; it was a sauce made out of pickled fish. Chefs in Great Britain often used mushrooms and walnuts as the main ingredient.

Tomatoes became popular in America because of ketchup, but not until almost the 1800s. Before then tomatoes were considered poisonous and people did not eat them! Tomatoes were called "love apples" and belong to the "nightshade" family, which includes some very toxic plants. The tomato plant has a tiny bit of poison in the leaves and unripe fruit, but not enough to hurt a person. Before the 19th century, Americans mostly grew tomatoes as a decorative garden plant. Eventually word spread that tomatoes were not toxic, and they ended up in ketchup.

Today tomatoes are a delicious vegetable for our soups and salads. However, it turns out that tomatoes are not a vegetable at all but a fruit. Tomatoes come from the middle of a flower on the tomato plant and contain the seeds of the plant so therefore are a fruit. However, even the Supreme Court of the United States said that tomatoes should count as a vegetable. The Court heard a case involving the taxing of vegetables. There was an argument about whether tomatoes were a fruit or vegetable. The Supreme Court decided that for legal purposes, the tomato would be classified as a vegetable because it is eaten with dinner and not dessert. One hundred years later, the state of Arkansas got in on the fun when they made the tomato the official state fruit and the official state vegetable!

So, the next time you are opening a tiny packet of ketchup to enjoy with your fries, or eating the cherry tomato off of your salad, remember all the history behind the tomato.

i. Write down a suitable title for the above text. (01 marks)

.......................................................................................................................

ii. By reading the above complete story, what conclusion can you come up with? (02 marks)

.......................................................................................................................

.......................................................................................................................

iii. Who took the ketchup to Great Britain? (01 marks)

.......................................................................................................................

iv. What were the main ingredients used to prepare ketchup by chefs in Great Britain? (02 marks)

.......................................................................................................................

v. What was the opinion of the people on tomatoes before the 1800s? (02 marks)

.......................................................................................................................

vi. What was the justification that the United States Supreme Court used to say that tomatoes should count as a vegetable? (02 marks)

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

vii. Write down a summary on the above text in about 75 words. (05 marks)

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

2. Write down the correct form of the verbs to fit the blanks. (20 marks)

1. If I ............... (met) him this evening, I'll give him the message.
2. He ............... (read) a book in the garden.
3. You can turn off the lights. I ........... (not use) them.
4. Don't worry. His condition ............ (improve) gradually.
5. Yesterday, I ............... (complete) my homework.
6. My mother ............. (prepare) dinner for everyone when she ran out of gas.
7. The dinner ............ (smell) great.
8. He ........... (play) tennis most of his evening.
9. He ............. (complete) the employee performance reviews.
10. Researchers ........... (use) this method since it was developed.

3. Fill in the blanks using the appropriate preposition. (20 marks)

i. This shop doesn't have the fashions I was looking .......

a. up b. for c. in d. on

ii. The teacher divided the papers .......... all the students.

a. for b. between c. among d. to

iii. The servant is grateful .......... its owner.

a. to b. for c. in d. at

iv. Our anniversary is .......... 5th November.

a.in b. to c. on d. since

v. The girl who is .......... the reception is quite young.

a.at b. on c. in d. for

vi. Mahatma Gandhi was born ........... 2nd October.

a. on b. in c. for d. at

vii. While waiting for my train, I took a walk ............ the station.

a. of b. around c. across d. for

viii. Mary has been in the United States .............. a year.

a. at b. for c. during d. since

ix. I try to get to school ........... time to have a cup of coffee before my first class.

a. on b. till c. by d. at

x. We accept your kind invitation ............ pleasure.

a. with b. by c. in d. through

4. Turn the following active voice sentences into passive voice (20 marks)

i. My brother bought a new house.

.....................................................................................................

ii. I am reading an interesting novel.

.....................................................................................................

iii. They painted the building yesterday.

.....................................................................................................

iv. They were singing a song in the lesson yesterday

.....................................................................................................

v. They have completed the decorations a few days ago.

.....................................................................................................

vi. The president will open the bridge tomorrow.

.....................................................................................................

vii. Governors prepare rules for the country.

.....................................................................................................

viii. We are planting trees for a better future.

.....................................................................................................

ix. The government has declared a special holiday for the students.

.....................................................................................................

x. The servant cleaned the windows of my room.

.....................................................................................................

5. Choose one of the topics and write an essay on it using around 250 words. (15 marks)

1. The most admirable person in my life.
2. Importance of learning English
3. Why do we need to have a hobby?

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

## *Part B*

6. Discuss the application of local expressions and idioms to show the Sri Lankan identity in the poem "The Cobra" by Lakdasa Wikramasinghe.

(10 marks)

7. The short story "Stench of Kerosene" by Amrita Pritam represents how some traditions and cultures can be harmful to human life. Discuss this statement by giving examples.

(10 marks)

************